


විදුදය

භාෂා, සාහිත්‍ය, සංස්කෘතික හා මාධ්‍ය අධ්‍යයන ශාස්ත්‍රීය සංග්‍රහය

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

VIDUDAYA

Journal of Language, Literary, Cultural and Media Studies

Department of Sinhala and Mass Communication, University of Sri Jayewardenepura

2023, 02 (02): 37-49

ISSN: 3051-5424

Journal homepage: https://journals.sjp.ac.lk/index.php/vidudaya


# පුවත්පත් ආචාරධර්ම සහ ළමා අපයෝජන වාර්තාකරණය

## Newspaper Ethics and Child Abuse Reporting


වාසනා මධුශානි වීරහීන්ගේ

සහාය කථිකාචාර්ය

සිංහල හා ජනසන්නිවේදන අධ්‍යයනාංශය

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

wasanamadu97@gmail.com



## Abstract

Although the child, who is considered a wonderful product of the universe and the lifeblood of the entire world, is a living entity that has more legal and social protection compared to other human groups, under the current social situation, child abuse is a strong social problem. This research was done to find out how the reporting of child abuse is portrayed in the press. The analysis of the ethical situation in the entire sample focused on ethical violations in abuse reporting by newspaper, ethical violations in abuse reporting by month, and the nature of ethical violations in newspaper abuse reporting. Through the analysis of these facts, it was recognized that there was a need to present not only the reporting but also the awareness needed to prevent such incidents from happening again, taking care of journalistic ethics in the reporting of child abuse.



**Keywords:** newspaper, child abuse, press media reporting

## 1. හැඳින්වීම

ළමා පරපුර සමාජයක අගනාම සම්පත බව අවිවාදයෙන් පිළිගත යුත්තකි. ළමා අයිතිවාසිකම් පිළිබඳව දක්වා ඇති 1989දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කරගත් ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ *(Convention of the right of child)* පළමු වගන්තියේ ළමයෙක් යනු කවරෙක්ද, යන්න අර්ථ දක්වා තිබේ. එනම්, "ළමයෙකු වශයෙන් එම ළමයාට අදාළ නීතිය යටතේ වයස අවුරුදු 18ට පෙර ඔහු වයස් පූර්ණත්වය ලබන්නේ නම් මිස වයස අවුරුදු 18ට අඩු සෑම මනුෂ්‍යයෙකුම ළමයෙකු ලෙස අදහස් වේ. මේ අනුව අවුරුදු 18ට අඩු සෑම මනුෂ්‍යයෙකුම ළමයෙක් ලෙස අර්ථ දක්වා ඇත" (ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිය 1989, 1993:02).

එමෙන්ම ළමයා යනු ජීව විද්‍යාත්මකව නිර්වචනය කරන්නේ, "කායිකව මානසිකව මෙන්ම සමාජීය වශයෙන් පූර්ණත්වයට පත් නොවූ වර්ධනය වෙමින් පවතින පුද්ගල කොට්ඨාසයක් වශයෙනි." නීතිමය වශයෙන් ළමයා යන්න අර්ථ දක්වන්නේ, "පහසුවෙන් තවත් තැනැත්තෙකුට ගොදුරු කරගත හැකි හා පහසුවෙන් පීඩාවට පත්වන පුද්ගල කොට්ඨාසයක් වශයෙනි" (ජාතික ළමා ආරක්ෂක අධිකාරිය 2012: 24).

සිංහල භාෂාවට අනුව "අප" යනු වැරැද්දයි. "යෝජනය" යනු යෙදවීමයි. එනම් ළමා අපයෝජනය යනු ළමයින් වැරැද්දේ යෙදවීම ලෙස දැක්විය හැකිය (ප්‍රේමසිරි, 2006: 01).

ළමා අපයෝජනය යන්න ලෝකයේ මෙන්ම ශ්‍රී ලාංකික ජන සමාජය තුළ පැන නැගී ඇති සංකීර්ණ සමාජ ගැටලුවකි. දෙදහස් එකොළහ (2011) අංක දහහත (17) දරන පාසල් ළමා ආරක්ෂක කමිටුව පිළිබඳ අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛනය මගින් ළමා අපයෝජනය යන්න පහත පරිදි නිර්වචනය කොට ඇත. "ළමයෙකුගේ සංවර්ධනයට බාධා වන අයුරින් කායිකව, මානසිකව හෝ ලිංගික අපයෝජනයට, පීඩනයට ලක් කිරීම මෙන්ම තම නෛතික වගකීම් පැහැර හැරීමෙන් හෝ නොසැලකිලිමත්කමින් ළමයෙකුට එකී හිංසනයට හෝ පීඩනයට ගොදුරු වුවහොත් එය ළමා අපයෝජනයකි" (ගුණසේකර, 2017: 6). ළමා අපයෝජනය ප්‍රධාන වශයෙන් ශාරීරික අපයෝජන, මානසික අපයෝජන, ලිංගික අපයෝජන, නොසලකා හැරීම ලෙස කොටස් හතරකට බෙදා දක්වයි.

පුවත්පත සමාජ මතය ගොඩනැගීමට හා තොරතුරු සම්ප්‍රේෂණය කිරීම සඳහා යොදාගත හැකි සුදුසුම හා ප්‍රබලතම මාධ්‍යයක් වේ. පොදුවේ පුවත්පත යනු සිද්ධි හා සිදුවීම් ඇතුළත් පාඨක පිරිසක් ඉලක්ක කරගෙන ලෝකය පුරා ව්‍යාප්ත වන සේ ප්‍රකාශයට පත් කරනු ලබන ලිඛිත සන්නිවේදන ක්‍රමයක් ලෙස හඳුනාගත හැකිය. ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත මගින් පුවත්පත් අර්ථකථනය කරනු ලබන්නේ, "පොදු පුවත්, ආරංචි වූ සිදුවීම් ඇතුළත් කොට ශ්‍රී ලංකාවේ මුද්‍රණය කරනු ලබන හෝ පළ කරනු ලබන පත්‍රයක්" යනුවෙනි (ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත, 1973). ඔක්ස්ෆර්ඩ් *(Oxford)* ශබ්දකෝෂය පුවත්පත හඳුන්වාදී ඇත්තේ "මහජනතාව උනන්දුවක් දක්වන ප්‍රවෘත්ති, වෙළඳ දැන්වීම්, සාහිත්‍ය හා සම්බන්ධ කරුණු හා අනෙකුත් අංග ඇතුළත්ව දිනපතා හෝ සතිපතා පළ කරන මුද්‍රිත පුවත්පතක්" ලෙසිනි (The shorter oxford English Dictionary, 1972).

වාර්තාකරණය යනු ශිල්පයක්, කලාවක් සහ ප්‍රජාතන්ත්‍රවාදී ජනතාවට අවශ්‍ය ආකාරයේ සමාජයක් ගොඩනැගීමේ සහ පවත්වාගෙන යාමේ ප්‍රධාන මාධ්‍යකි. පුවත්පතක් කෙරෙහි පාඨක රුචිය තබා ගැනීමේ ප්‍රබල සාධකය වන්නේ පුවත් වාර්තාකරණයයි. එහිදී සත්‍ය හා නිවැරදි තොරතුරු පාඨකයන්ගේ විශ්වාසනීයත්වය රැක ගැනීමට හැකි අයුරින් ඉදිරිපත් කිරීමට පුවත්පත් වාර්තාකරුවා කටයුතු කළ යුතු වේ. විශේෂයෙන් ළමා අපයෝජන වාර්තාකරණයේ ජනමාධ්‍යවේදීන් විසින් වඩාත් සැලකිලිමත් ආකාරයෙන් එම වාර්තාකරණයන් කිරීමට යොමුවිය යුතුය. ළමයාටත්, සමාජයටත්, අසාධාරණයක් නොවන ආකාරයෙන් වාර්තාකරණයේදී කරුණු විග්‍රහ කළ යුතුය. ආචාරධර්ම හෙවත් *Ethics* යන වචනය ඇරිස්ටෝටල් දර්ශනයත් සමග ප්‍රචලිත වූ පැරණි ග්‍රීක වචනයක් වූ *Ethos* යන්නෙන් බිඳී ආවකි. එය සදාචාරය හා චරිතවත් බව සමඟ බැඳී ඇත (හපුආරච්චි, 2004). ජනමාධ්‍ය

ආචාරධර්ම පද්ධතියක් ජනමාධ්‍ය උදෙසා සකස් වන්නේ, ජනමාධ්‍ය සමාජය තුළ පරමාදර්ශී ගුරුවරයෙකුගේ කාර්යය සිදුකළ යුතුය යන සාමාජික ආකල්පය හේතු කරගෙනය (හපුආරච්චි, 2004). පුවත්පත් සම්බන්ධව ඉදිරිපත්ව ඇති ආචාර ධර්ම පිළිබඳ විමසීමේදී ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ආචාරධර්ම, ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසම මගින් ඉදිරිපත් කරන ආචාරධර්ම ලෙස ප්‍රධාන වශයෙන් කොටස් 02ක් හඳුනාගත හැකිය.

1973 අංක 5 දරන ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනත යටතේ 1981 වර්ෂයේදී පුවත්පත් මණ්ඩලය විසින් පුවත්පත් කලාවේදීන්ගේ ආචාර ධර්ම සංග්‍රහයක් හඳුන්වාදී ඇත. මෙය රීතීන් 11කින් සමන්විත වන අතර එවක පුවත්පත් ප්‍රධාන සංස්කාරකවරුන් විසිපස් දෙනකුගෙන් සමන්විත මණ්ඩලයක් විසින් සකස් කර ඇත.

පුවත්පත් පැමිණිලි කොමිසම මගින් ඉදිරිපත් කරන ආචාර ධර්ම පද්ධතිය 2003 ඔක්තෝම්බර් මස ප්‍රකාශයට පත් කරන ලදි. ශ්‍රී ලංකා කර්තෘ සංසදය ඉදිරිපත් කළ වෘත්තිමය මාර්ගෝපදේශ සංග්‍රහය මෙයයි. පුවත්පත් පැමිණිලි කොමිසම මගින්ද පිළිගත් වෘත්තිය ආචාරධර්ම පද්ධතියක් වේ. මෙම වෘත්තිය මාර්ගෝපදේශ සංග්‍රහය අවස්ථා දෙකකදී යාවත්කාලීන කර ඇති අතර පුවත්පත් කලාවේදීන් සඳහා සකස් කළ ස්වයං නියාමන ක්‍රමවේදයක් ලෙස නම් කර තිබේ. මෙය ප්‍රධාන කොටස්/ මාතෘකා 10ක් ඔස්සේ පෙළගස්වා ඇත. ඒ අනුව මෙම අධ්‍යයනයෙහි දත්ත විශ්ලේෂණය උක්තයෙහි දක්වන ලද ආචාරධර්ම අදාළතාව මත පදනම් කරගනිමින් සිදුකර ඇත.

ලංකාව වැනි සංවර්ධනය වෙමින් පවතින රටක ළමා අපයෝජනය වසංගතයක් සේ පැතිරී ගොස් රටේ සංවර්ධනයත්, ළමුන්ගේ අනාගතයත් විනාශ කර දමති'යි බියක් සිතෙන තරමට තත්ත්වය උග්‍ර වී ඇත. නොවරදවාම දිනපතා පුවත්පත්වල ළමා හිංසනයක් සම්බන්ධ පුවතක් පළවීම සාමාන්‍ය දෙයක් බවට පත්ව තිබේ. නමුත්, එම වාර්තාකරණය නිසි ප්‍රමිතීන්ට අනුකූලව සිදුවීම පිළිබඳව පවතින්නේ ගැටලු සහගත තත්වයකි. සියලු මාධ්‍ය අපයෝජන සිදුවීම් වාර්තා කළ යුතු වන්නේ ඇතිවී තිබෙන තත්වයට සාධාරණය ඉටු කිරීමට හා අවම කිරීමටය. එබැවින් ළමා අපයෝජනය පිළිබඳ වාර්තාකරණයේදී පුවත්පත් මාධ්‍ය තුළ නිසි වාර්තාකරණයක් සිදුවන්නේද යන්න සොයා බැලීම මෙම පර්යේෂණය හරහා සිදු කරනු ලැබේ. ළමා අපයෝජන පිළිබඳ වාර්තාකරණයේදී පුවත්පත් මාධ්‍ය වාර්තාකරණය පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වනු ඇත.

## 2. ක්‍රමවේදය

දිනමිණ සහ ලංකාදීප පුවත්පත්වල ළමා අපයෝජන පිළිබඳ වාර්තාකරණ මෙම පර්යේෂණ අධ්‍යයනයේ සංගහණයයි. පර්යේෂණය සඳහා අසම්භාවී නියැදි ක්‍රමයට අයත් පහසු නියැදිය තෝරා ගන්නා ලදි.

මාධ්‍ය ලෝකය තුළ අපයෝජන වාර්තාකරණය සම්බන්ධව කරන ලද පර්යේෂණ විමසුමේදී සෙසු මාධ්‍යයන්ට සාපේක්ෂව පුවත්පත් වාර්තාකරණය සම්බන්ධව සිදුව ඇති පර්යේෂණ ප්‍රමාණය සීමිත බැවින් මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා පුවත්පත් මාධ්‍ය යොදාගනු ලැබීය. ඒ අනුව සංගහණය තුළින් පර්යේෂණ අධ්‍යයනයේ නියැදිය වශයෙන් තෝරා ගන්නා ලද්දේ 2021.07.01 දින සිට 2021.08.31 දක්වා වූ මාස දෙකක කාල පරාසය තුළ දිනමිණ සහ ලංකාදීප දිනපතා පුවත්පත් තුළ වාර්තා වූ ළමා අපයෝජන පිළිබඳ පුවත්පත් වාර්තා කිරීමය. මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා දත්ත රැස් කිරීම සඳහා ප්‍රාථමික දත්ත මූලාශ්‍රය ලෙස සහභාගීත්ව නිරීක්ෂණ හා ද්විතීයික දත්ත මූලාශ්‍රය ලෙස පුවත්පත්, පොත්පත්, ශාස්ත්‍රීය සඟරා, පර්යේෂණ ලිපි, පර්යේෂණ පත්‍රිකා, නෛතිකමය මූලාශ්‍රය, අන්තර්ජාල වෙබ් අඩවි හා ලේඛන භාවිත කරන ලදි. මෙහිදී පර්යේෂණය සඳහා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය භාවිත කරන ලද අතර ද්විතීයික මූලාශ්‍රය සහ ප්‍රාථමික මූලාශ්‍රය හරහා ලබාගන්නා

දත්ත විශ්ලේෂණය ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණය හා ගුණාත්මක දත්ත විශ්ලේෂණය යන ආකාර ද්විත්වයකට අනුව සිදු කෙරිණි.

## 3. සාකච්ඡාව

ළමා අපයෝජනය ශ්‍රී ලංකාවේ වර්තමානයේ පවතින ප්‍රබල සමාජ ගැටලුවක් බැවින්, ළමා සමාජය සුරක්ෂිත අනාගතයකට භාරදීම සඳහා මේ පිළිබඳ වන වාර්තාවීම් කෙරෙහිද අවධානය යොමු කිරීම අතිශය වැදගත්ය. එබැවින්, මාධ්‍ය වාර්තාකරණය තුළ සදාචාර සම්පන්න ප්‍රතිපත්ති, ආචාරධර්ම, මත පිහිටා කටයුතු කළ යුතුව ඇත. ඒ අනුව 2021 වසරේ ජූලි සහ අගෝස්තු මාස දෙකක කාලය තුළ (2021.07.01 - 2021.08.31) දිනමිණ සහ ලංකාදීප දිනපතා පුවත්පත් තුළ පළ වූ ළමා අපයෝජන වාර්තා අධ්‍යයනය සඳහා තෝරා ගැනුණි. ළමා අපයෝජනය වර්ධනය වීමේ ප්‍රවණතාවක් පවතින මෙම කාලසීමාව තුළ, පුවත්පත් වාර්තාකරණ හරහා එයට වන බලපෑම විමසමින් මෙම අධ්‍යයනය කරනු ලබන අතර, එහිදී ළමා අපයෝජන සිදුවීම් වාර්තාකරණ අන්තර්ගතය පිළිබඳ ගැඹුරු අන්තර්ගත විශ්ලේෂණයක් මෙම පර්යේෂණය හරහා සිදු කරනු ඇත.

සමස්තයක් ලෙස සලකා බැලීමේදී වයස අවුරුදු 18ට අඩු සෑම තැනැත්තකුම ළමයෙකු ලෙස පොදුවේ අර්ථ විවරණය කළ හැකිය. තවද, මේ සඳහා ගැහැනු, පිරිමි, ජාති, ආගම්, වැනි කිසිදු විභේදනයක් බලනොපායි. සිංහල භාෂාවේදී ළමයා යනු ළදරුවා, ළදරු වයසේ තැනැත්තා, බාලවයසේ දරුවා ලෙස හඳුන්වා දියහැකි අතර ඉංග්‍රීසි භාෂාවෙන් *Child* යනුවෙන් ව්‍යවහාර කරන අතර එයට විවිධ අර්ථ නිරූපණය කර ඇත.

- Young human being below the age of puberty
- Uriborn or new born human being
- One’s son or daughter (www.merriam-webster.com)

ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 76 වගන්තිය මගින් ළමයෙකු යන්න මෙසේ සඳහන් වේ. එනම්,

“යම් අවස්ථාවකදී තමාගේ හැසිරීමේ ස්වභාවය සහ එහි ප්‍රතිඵලය නිශ්චය කිරීමට ප්‍රමාණවත් ලෙස පැසුණු බුද්ධියක් නොලත් වයස අවුරුදු 8ට වැඩි අවුරුදු 12ට අඩු ළමයෙක් විසින් කරනු ලබන කිසියම් වරදක් වරදක් නොවේ යනුවෙනි”. මෙමගින් අවුරුදු 8ට වැඩි 12ට අඩු පුද්ගලයෙකු ළමයෙක් ලෙස දක්වා ඇත. (දණ්ඩ නීති සංග්‍රහය, 15 අධිකාරිය, 15).

රටක අනාගතය, ජීවය දරුවන්ය. ළමා අයිතීන් සුරැකීම සඳහා ප්‍රකාශිත විශේෂ ප්‍රකාශන කිහිපයක් විශේෂයෙන් හඳුනාගත හැකිය.

- 1924දී ප්‍රකාශිත ළමා අයිතීන් පිළිබඳ ජිනීවා ප්‍රකාශය
- 1959දී සම්මත කරගන්නා ලද ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශය
- මිනිස් අයිතිවාසිකම් පිළිබඳ විශේෂ ප්‍රකාශය
- සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය

මෙම සියලු අර්ථකථන හා නිර්වචන අණපනත් ආදිය සැලකිල්ලට ගැනීමේදී ළමයා යනු වයස අවුරුදු 18ට අඩු වයසේ පසුවන පුද්ගලයකු වශයෙන් අපට මෙහිදී හඳුනාගත හැකි වේ. ළදරු වයසේ අහිංසකත්වයත් වැඩිහිටි වයසේ අභිමානයත් අතර අපට දක්නට ලැබෙන්නේ ළමයා යනුවෙන් හඳුන්වනු ලබන අපූර්ව නිර්මාණය වේ.

ළමා අපයෝජනය යනුවෙන් අදහස් කරන්නේ ළමයාගේ සෞඛ්‍යයට සහ වර්ධනයට ඇත්ත වශයෙන්ම හානිකර හෝ හානිවීමට මග සලසන සහ ළමයා වේදනාවන්වලට ලක් කරන ක්‍රියාවන් කිරීමය. ළමයෙකුගේ යහපත වෙනුවෙන් යම් තැනැත්තෙකු විසින් කළ යුතුව තිබූ යම් දෙයක් නොකර සිටීම මගින්ද ළමා අපයෝජනය සිදුවිය හැකිය (ශ්‍රී ලංකාවේ පොලිස් දෙපාර්තමේන්තුව, 1990: 6).

මේ අනුව, ළමයාගේ පැවැත්මට හෝ සංවර්ධනයට හෝ ගරුත්වයට හෝ හානිවන හෝ හානිවීමට ඉඩ ඇති සියලුම ආකාරයේ සම්බන්ධතා, වගකීම්, ශාරීරික හෝ මානසික හිරිහැර, ලිංගිකඅඩන්තේට්ටම්, නොසලකා හැරීම් හෝ වාණිජමය හෝ වෙනත් ආකාරවලට දරුවන් භාවිතය ළමා අපයෝජනය ලෙස හඳුනාගත හැකිය.

ළමා අපයෝජනය පිළිබඳ වර්ගීකරණය විවිධ වූවද පොදුවේ මූලික අපයෝජන වර්ග 04ක් ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින් හඳුනාගෙන ඇත.

- ශාරීරික අපයෝජනය
- ලිංගික අපයෝජනය
- මානසික අපයෝජනය
- නොසලකා හැරීම

වශයෙන් ප්‍රධාන ප්‍රභේද දක්වා ඇත. එම ළමා අපයෝජන වර්ග 04කට සිදුවන සියලුම ළමා අපයෝජන වර්ග ඒකරාශිවී ඇත. මේ අනුව පැහැදිලි වන කරුණක් වන්නේ ක්‍රියාවෙන්, කථාවෙන්, හැසිරීමෙන් මේ ආදී කුමන ක්‍රියාවකින් වූවද දරුවාට නොගැළපෙන ආකාරයෙන් හැසිරීම ළමා අපයෝජනය වන බවයි.

"කායික අපයෝජනය හෙවත් ශාරීරික අපයෝජනය යනු හිතාමතා දරුවෙකුට එරෙහිව එම දරුවාගේ සෞඛ්‍යයට පැවැත්මට සංවර්ධනයට හා ගරුත්වයට හානි වන ආකාරයට ශාරීරික බලය පැතිර පැතිරවීමයි." (පතිරණ, 2008: 3).

ශාරීරික අපයෝජනය ලෙස තුවාල සිදුකිරීම්, පහරදීම්, පිළිස්සීම්, හැපීම්, කැපීම්, පෙනීමට හානි වන ආකාරයේ කරනු ලබන ක්‍රියාවන්, අස්ථි බිඳීයාම්, ශරීර අභ්‍යන්තරයේ හා බාහිර වශයෙන් සිදුවන ලේ ගැලීම් මෙන්ම ඇතැම් අවස්ථාවලදී ශරීරයේ ඉන්ද්‍රිය ක්‍රියාකාරිත්වයට හානිදායක වන තත්ත්වයන් ආදියද මේ යටතට ගැනේ. මෙවැනි ශාරීරික අපයෝජනයන් දරුවන් සඳහා සිදු නොකළ යුතු බව ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියේ 37 වන ව්‍යවස්ථාවේ තවදුරටත් දක්වා ඇත. ඒ අනුව එහි (අ) වගන්තියෙහි එන ආකාරයට,

"කිසිම ළමයෙකු වදහිංසාවලට හෝ වෙනත් කෘුර අමානුෂික හෝ නොහොඹිනා සැලකිල්ලට හෝ දඩුවම්වලට හෝ යටත් කරනු නොලැබිය යුතුය." (1989 ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තිය, 37වන ව්‍යවස්ථාව, (අ) වගන්තිය) ලෙස හඳුනාගත හැකිය.

මානසික අපයෝජනය ළමයාගේ චිත්තවේගමය සංවර්ධනයට හානිකරනු ලබන්නකි. මෙයට වැඩිහිටියෙකු විසින් ළමයෙකුට කරනු ලබන දරුණු සෘණාත්මක චිත්තවේගමය තත්ත්වයන් ඇති කරන්නා වූ ආකල්පයන් හෝ ක්‍රියාවන් ඇතුළත් වේ (ශාත්විගන්, 2013: 14).

ළමා මානසික අපයෝජනය සිදු වන්නේ පුරුද්දක් වශයෙන් ළමයෙකු අවමානයට, නින්දාවට පාත්‍ර කිරීම මගින් ජීවන පැවැත්මට අත්‍යවශ්‍ය පෝෂණය ලබා නොදීම නිසා ආදී වශයෙන්ය (හේවාවසම්, 2018: .55).

"විවිධ කාණ්ඩවල මෙන්ම විවිධවූ සංවර්ධනාත්මක අවධීන්හි පසුවන දරුවන් අවබෝධයක් නොමැතිව ලිංගික ක්‍රියාවන් සඳහා යොදා ගැනීම, පොලඹවා ගැනීම, ලිංගික අපයෝජනයයි" (ගුණසේකර, 2017: 5). ලෝක සෞඛ්‍ය සංවිධානය විසින්ද ළමා ලිංගික අපයෝජනය පිළිබඳ පහත පරිදි අර්ථකථනයක් සපයා ඇත.

"ළමුන් ලිංගික ක්‍රියාකාරකම්වල යෙදවීම, ඔවුන්ගේ සංවර්ධන මට්ටමට නොගැළපෙන ලිංගික ක්‍රියාකාරකම්වල යෙදවීම, මෙන්ම සමාජ නීතීන් හා සංස්කෘතීන්වලට පටහැනිව ළමුන් සම්බන්ධ කරගනිමින් සිදුකරනු ලබන ලිංගික ක්‍රියාකාරකම් ළමා ලිංගික අපයෝජනය වශයෙන් දැක්විය හැකි බවයි. මෙම ලිංගික අපයෝජනය එක් පුද්ගලයෙකුගේ අවශ්‍යතාවක් ඉටුකර ගැනීම සඳහා ළමයෙකු හෝ වැඩිහිටියකු අතර මෙන්ම, ළමයෙකු හා එම වයසේ පසුවන තවත් ළමයෙකු අතර සිදුවිය හැක්කකි.

දරුවෙකුගේ සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය පෝෂණය, පිළිගැනීම, ඖෂධ, අධ්‍යාපන, සුරක්ෂිත ජීවන තත්ත්වය, වැනි උවමනා ඉටු කිරීම හිතාමතා පැහැර හැරීමෙන් දරුවෙකුට සිදුවන අගතිය නොසලකා හැරීමේ අපයෝජනය යටතට ගැනේ. ලෝක සෞඛ්‍ය සංවිධානය විසින්ද නොසලකා හැරීම නම් වූ ළමා අපයෝජන වර්ගය පිළිබඳ එලදායි නිර්වචනයක් 1999 වර්ෂයේදී ඉදිරිපත් කර ඇත.

ළමුන්ගේ සෞඛ්‍ය, අධ්‍යාපනය, මානසික සංවර්ධනය, පෝෂණය, රැකවරණය හා ඔවුන්ගේ ජීවිත ආරක්ෂාවට බලපෑම් ඇති කරමින් ඔවුන් වෙත අවධානය යොමු කිරීම, පැහැර හැරීම, නොසලකා හැරීම වශයෙන් සලකනු ඇත. එමෙන්ම ළමුන්ගේ ශාරීරික, මානසික, ආධ්‍යාත්මික සංවර්ධනයට හානිවන සේ සිදු කරනු ලබන නොසලකා හැරීම්ද අදාළ වේ. ළමුන්ට මුහුණ දීමට සිදුවිය හැකි අවදානම් තත්ත්වයන් පිළිබඳව ළමුන්ව දැනුම්වත් කර නොතිබීමද ඔවුන් නොසලකා හැරීමක් වනු ඇත (පතිරණ, 2008: 4).

වාර්තාකරණය යනු ශිල්පයක්, කලාවක් සහ ප්‍රජාතන්ත්‍රවාදී ජනතාවට අවශ්‍ය ආකාරයේ සමාජයක් ගොඩනැගීමේ සහ පවත්වාගෙනයාමේ ප්‍රධාන මාධ්‍යකි. වාර්තාකරණය මගින් ගැටලු ගවේෂණයකර විස්තර සහිතව විනෝදාස්වාදය සහ දැනුම්වත් කිරීම සඳහා දායකත්වය ලබාදෙනු ඇත. පුවත්පතක් කෙරෙහි පාඨක රුචිය තබා ගැනීමේ ප්‍රබල සාධකය වන්නේ වාර්තාකරණයයි. එහිදී සත්‍ය හා නිවැරැදි තොරතුරු පාඨකයන්ගේ විශ්වාසනීයත්වය රැකගැනීමට හැකි අයුරින් ඉදිරිපත් කිරීමට පුවත්පත් වාර්තාකරුවා කටයුතු කළ යුතු වේ.

විශේෂයෙන් ළමා අපයෝජන වාර්තාකරණයේ ජනමාධ්‍යවේදීන් වඩාත් සැලකිලිමත් ආකාරයෙන් එම වාර්තාකරණයන් කිරීමට යොමුවිය යුතුය. ළමයාටත්, සමාජයටත්, අසාධාරණයක් නොවන ආකාරයෙන් වාර්තාකරණයේදී කරුණු විග්‍රහ කළ යුතුය. මෙහිදී ළමා අපයෝජන වාර්තාකරණයේදී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ අවධානය යොමු කිරීම වැදගත්ය.

- ළමා අපයෝජන සිද්ධීන් වාර්තා කිරීමේ දී අපයෝජනයන්ට ලක් වූ දරුවන්ගේ අනන්‍යතාව හෙළි නොකිරීම.

  බොහෝ ජනමාධ්‍යවේදීන් අපයෝජනයට ලක්වන ළමයින්ගෙ නම, ගම, වයස, පාසල, ඔවුන්ගේ පවුල්වල තොරතුරු වැනි අනන්‍යතාවන් හෙළිදරවු කරමින් තොරතුරු වාර්තා කරනු දක්නට ලැබේ. එලෙස ළමයින්ගේ අනන්‍යතාව හෙළි කරමින් වාර්තාකරණය කිරීම මගින් වින්දිත ළමයා මෙන්ම එකී ළමයාගේ සමස්ත පවුලම සමාජය ඉදිරියේ අපහසුතාවට පත් වේ.

- අපයෝජනයට ලක් වූ දරුවන්ගේ ඡායාරූප පළ නොකිරීම.

  වර්තමානයේ හුදු වාණිජමය පරමාර්ථවල සිටිමින් කටයුතු කරනු ලබන ජනමාධ්‍ය, ළමා අපයෝජනය හේතුවෙන් වින්දිතයන් බවට පත්වන ළමුන්ගේ ඡායාරූප දර්ශන සිය ජනමාධ්‍ය හරහා ප්‍රචාරය කිරීම ඛේදනීය තත්ත්වයකි.

  එමෙන්ම මෙලෙස ජනමාධ්‍ය හරහා විකාශනය කරන අපයෝජනයට පත් වින්දිත ළමුන්ගේ ඡායාරූප සමාජ ජාල වෙබ් අඩවි හරහා ප්‍රචාරය වීමද බරපතළ ගැටලුවකි. නමුත් ජනමාධ්‍ය මෙම තත්ත්වය තුළ ස්වයං වාරණයක් පවත්වා ගැනීම ප්‍රමුඛ කාරණයක් වනු ඇත.

- සිදුවීමට අදාළව අසත්‍ය කරුණු පළ නොකිරීම.

ළමා අපයෝජන පිළිබඳ සිදුවීමක් පූර්ණ විශ්වාසයකින් පළ කළ යුතුය. කිසිවිටෙක අසත්‍ය කරුණු පළ නොකිරීමට ජනමාධ්‍යවේදීන් වගබලා ගත යුතුය. විශේෂයෙන් ප්‍රවෘත්තියක තිබිය යුතු මූලිකම අංගයක් වන්නේ සත්‍යවාදී බවයි. ඒ අනුව ජනමාධ්‍යවේදීන් සිය වගකීම ඉටු කළ යුතුය.

- ළමා අපයෝජන පිළිබඳ සිද්ධීන් අනුමානය හා උපකල්පනය මත වාර්තා නොකළ යුතුය.

  ළමා අපයෝජන වාර්තා කිරීමකදී කිසියම් සිදුවීමක් මෙසේ වන්නට ඇතැයි සිතා පූර්ව නිගමනයක සිට පළකිරීම සිදුනොකළ යුතුය. ඇතැම් ජනමාධ්‍යවේදීන් ළමා අපයෝජන පිළිබඳ වාර්තාකරණය තුළ අනුමානය හා උපකල්පනය භාවිත කරනු නිරීක්ෂණය විය.

- ලිංගික අපයෝජන සිද්ධීන් වාර්තා කිරීමේදී මනා විනයක් පවත්වා ගෙන යාම.

  ඇතැම් පුවත්පත් වාර්තා කිසිදු විනයකින් තොරව පළකරන ලිංගික අපයෝජන සිද්ධීන් දක්නට ලැබේ. අපයෝජකයා ලිංගික අපයෝජනය සිදු කිරීමට යොමු වූ අවස්ථාවේ සිට එකී අපයෝජනය අවසානය වන තෙක් ඔහු කරන ලද සියලු ක්‍රියාවන් ඇතැම් වාර්තා තුළ ලියවෙනු දක්නට ලැබේ. නමුත් එවැනි දේ කිසිවිටෙක සිදු නොවිය යුතුය.

- පොදුජන රුචියට හෝ සදාචාරයට හානි නොවන අයුරින් අදාළ සිදුවීම් වාර්තා කිරීම.

  ඇතැම් ජනමාධ්‍යවේදීන් ළමා අපයෝජන සිද්ධීන් වාර්තාකරණය කරන්නේ සමාජයට කිසිදු ළමා ආරක්ෂණ පණිවිඩයක් නොලැබෙන පරිදි සම්මත රුචිකත්වයට හා සදාචාරයට පටහැනි වෙමිනි. එබැවින් වාර්තාකරණය පොදුජන රුචිකත්වයට හෝ සදාචාරයට හානි නොවන අයුරින් අදාළ සිදුවීම වාර්තා කළ යුතුය.

- අදාළ සිදුවීම් වාර්තා කිරීම පමණක් නොව, එවැනි සිදුවීම් නැවත ඇති නොවීමට අවශ්‍ය දැනුම්වත් වීම සිය වාර්තාකරණය හරහා ජනතාවට ලබාදීම.

  ළමා අපයෝජන සිදුවීම් පිළිබඳ හුදු වාර්තා කිරීම පමණක් අවශ්‍ය නොවන අතර අවශ්‍ය වන්නේ එවැනි සිදුවීම් ඇති නොවීමට අවශ්‍ය දැනුම්වත් කිරීම සමාජය වෙත ලබාදීමයි.

ජනමාධ්‍යවේදීන් සිය වාර්තාකරණය තුළදී,

- එම අපයෝජනය සිදු වීමට බලපාන ලද හේතු සාධක කවරේද?
- එම අපයෝජනයට අදාළව නිසි පරිදි නීතිය ක්‍රියාත්මකවී තිබේද?
- වින්දිත දරුවන්ට මනෝ සමාජීය රැකවරණය ලබාදී එකී දරුවා සමාජගත කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර තිබේද?
- මෙවැනි සිදුවීම් නැවත ඇති නොවීමට කටයුතු කළ යුත්තේ කෙසේද?

යනාදී කාරණා කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත් වන අතර ඒ හරහා එවැනි සිදුවීම් නැවත ඇති නොවීමට අවශ්‍ය කරන දැනුම්වත්භාවය ජනතාවට ලැබෙනු ඇත.

ජනමාධ්‍ය සිය වාර්තාකරණය හරහා අපයෝජනයට පත් කිසියම් ළමයෙකු වාර්තාකරණය හරහා තවදුරටත් සමාජය ඉදිරියේ අපහසුතාවට පත් නොවන අයුරින් ළමා ආරක්ෂාව පිළිබඳ විෂය සමාජගත කිරීමත් ඒ සඳහා ජනමාධ්‍ය කාර්යභාරය නිසි පරිදි ඉටු කිරීමටත් කටයුතු කළ යුතුය. එහිදී සමාජ වගකීම ගැන වැඩි අවධානය යොමු කරමින් අදාළ සිද්ධිය ගවේෂණාත්මක වාර්තාකරණයක් හරහා වාර්තා කිරීමට ජනමාධ්‍යවේදීන්

සැලකිලිමත්ව ක්‍රියා කළ යුතුවනු ඇත. අපයෝජනයට එරෙහිව තමන් ආරක්ෂා වන්නේ කෙසේදැ'යි යන්න සම්බන්ධයෙන් ළමුන්ට තොරතුරු සම්පාදනය කිරීම ජනමාධ්‍යවේදීන්ගේ එක්තරා වූ වගකීමකි. නමුත් වර්තමානයේ ළමා අපයෝජන සිද්ධීන් ජනමාධ්‍ය මගින් වාර්තා කිරීමේදී ගැටලු සහගත තත්ත්වයන් මතුව ඇත. එබැවින් වාර්තාකරණ ක්‍රියාවලිය තුළ විමසිලිමත්ව කටයුතු කළ යුතුය. තවද ළමා අපයෝජන පිළිබඳ වාර්තාකරණයේදී ජනමාධ්‍යවේදීන් විසින් විවිධ කරුණු පිළිබඳ සැලකිලිමත් විය යුතුය.

- අපයෝජන සිද්ධියක් පිළිබඳව ජනමාධ්‍යවේදීන්ට තොරතුරු ලබාදෙන පුද්ගලයන් පිළිබඳව රහස්‍යභාවය උපරිමයෙන් රැකගැනීමට ජනමාධ්‍යවේදීන් සැලකිලිමත් විය යුතුය.
- පහත් ලිංගිකත්වයට හෝ ප්‍රචණ්ඩත්වයට අදාළ හැඟීම් දැනවීම අධෛර්ය කරවන සුළු ආකාරයෙන් අදාළ සිද්ධීන් වාර්තා කිරීමට වගබලාගත යුතුය.
- ළමා අපයෝජනය හැඟුම්බර වන පරිදි වාර්තා කිරීම නොව, ළමුන් අපයෝජනය වීමේ සමාජ සහ ආර්ථික කරුණු කෙරෙහි අවධානය යොමු කළ යුතුය.
- සෑම ළමයෙකුම වඩා හොඳින් ආරක්ෂා වීමේ අරමුණ වෙනුවෙන් ළමා ගැටලු පිළිබඳව වැඩිපුර උපදේශන සැපයීම සහ ළමා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම ඇතුළු ඊට අදාළ වෙනත් ඕනෑම ක්‍රියාමාර්ගයක් කෙරෙහි අවධානය යොමු කළ හැකිය.
- ප්‍රජනන සෞඛ්‍ය හා අධ්‍යාපනය සහ අවිහිංසාවාදී ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීමට ජනමාධ්‍යවේදීන් කටයුතු කළ යුතුය.
- ළමා අපයෝජන වළක්වා ළමා ආරක්ෂාව තහවුරු කිරීම සඳහා රජයට, සිවිල් සංවිධානවලට, ප්‍රජාවට සහ දෙමාපියන්ට ගතහැකි පියවර හෝ ප්‍රතිපත්ති නිර්දේශ කිරීමට ජනමාධ්‍යවේදීන්ට හැකිය.
- ළමා අපයෝජන සිද්ධීන්වලට අදාළ තොරතුරු මූලාශ්‍රයවල රහස්‍යභාවය සුරැකිය යුතුය.

ළමා අපයෝජන වාර්තාකරණය සම්බන්ධව අවධානයට ලක් කිරීමේදී සමස්තයක් ලෙස ළමා අපයෝජනවලින් දරුවන් ආරක්ෂා කර ගැනීමට අදාළ තොරතුරු සමාජගත කිරීමට ජනමාධ්‍යවේදීන්ට සිය වාර්තාකරණය හරහා සිදුකළ හැකිය.

ජන සමාජයේ පැවැත්ම සුරක්ෂා කරන්නා වූ ප්‍රවෘත්තිමය වටිනාකම් සහිත සංසිද්ධි තේරීමේදීත්, ඒවා වාර්තා කිරීමේදීත් මාධ්‍යවේදියාට සුවිශේෂ වගකීමක් පවතී. ජනමාධ්‍ය වෘත්තියට අදාළවද පිළිගත් ආචාර ධර්ම පද්ධතියක් පවතී. ඒ අනුව ආචාරධාර්මික පදනමක් මත මාධ්‍යකරණයේ නියැලීමට මාධ්‍ය වෘත්තිකයන්ට සිදුවන අතරම එය ඔහු හෝ ඇය වෘත්තිකයෙකු ලෙස කෙතරම් වගකීමකින් යුතුව කටයුතු කරනවාද යන්නට සාක්ෂි සපයයි.

මාධ්‍ය ආචාරධර්ම, ජනමාධ්‍ය හා ඒවා පිළිබඳ ප්‍රමිතීන් සමඟ සම්බන්ධ වන්නේය. එහෙත් ජනමාධ්‍ය විවිධ පුද්ගලයන්ගෙන් සංයුක්තවී ඇති බව මතක තබාගත යුත්තකි. එබැවින් ජනමාධ්‍යයක ආචාරධර්මීය පිළිවෙත්, එහි කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ ආචාරධර්මීය පිළිවෙත් මත රඳා පවතී. ජනමාධ්‍ය වූ කලී සමාජය කෙරෙහි සුවිශාල බලපෑමක් එල්ල කිරීමේ ශක්‍යතාවක් පවතින්නක් වන බැවින් සමාජ විශ්වසනීයත්වයට සාධාරණයක් ඉටු කිරීමට ඔවුහු ආචාරධර්මීය පදනමක් මත බැඳී සිටින්නාහ.

"මාධ්‍ය ආචාරධර්ම යනු අපැහැදිලි හෝ අනුචිත මාතෘකාවක් නොවේ. ජනමාධ්‍යයන්ට යොමුවන ජනතාව, සහභාගීවන්නවුන්, නිරීක්ෂකයන් හෝ විවේචකයන් වශයෙන් මාධ්‍ය ආයතනවල ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කිරීමේදී ඇතිවන අනිවාර්ය මාතෘකාවකි."

-මෙල්වින් ඩිෆ්ලුවර්-

(කරුණානායක, 2001: 249)

නියෝගාත්මකව මෙන්ම ස්වාධීනවද ආචාරධර්ම ක්‍රියාත්මක වේ. ප්‍රධාන ජනමාධ්‍ය ත්‍රිත්වයට මෙන්ම නව මාධ්‍ය සඳහාද සුවිශේෂ වූ ආචාර ධර්ම පද්ධතියක් පවතී. සියලු ආචාර ධර්මවල අවසාන අරමුණු තුනකි.

- සන්නිවේදනය ලබන්නන්, එනම් මහ ජනතාවගෙන් වැඩි දෙනෙකු ජනමාධ්‍යවල වගකීමෙන් තොර, සමාජ විරෝධී හෝ ප්‍රචාරාත්මක භාවිතයෙන් ආරක්ෂා කිරීම.
- සන්නිවේදකයන් වගකීමෙන් තොර කර, නින්දාවට ලක් කෙරෙන හෝ ඔවුන්ගේ සිතට විරුද්ධව ක්‍රියාකාරී ක්‍රියා කිරීමට පෙලඹීමෙන් හා පෙලඹවීමෙන් ආරක්ෂා කිරීම.
- ඉහළින් සහ පහළින් එන අභියෝග හෝ විධානවලින් තොරව සියලු ජන සන්නිවේදන මාර්ග විවෘතව තැබීම.

වශයෙනි. තවද, සමස්ත ලෝකයේම ජනසන්නිවේදන මාර්ගයන්හි ආචාරධර්ම ක්‍රියාත්මක කිරීමේදී ආකාර 04ක් හඳුනාගත හැකිය.

- සියලු සන්නිවේදන මාධ්‍යවලට පොදුවේ යොදා ගනු ලබන ආචාර ධර්ම
- සන්නිවේදනය කරනු ලබන සියලුම දේ ඇතුළත් ආචාර ධර්ම
- එක් අංශයකට පමණක් සීමාවූ ආචාර ධර්ම
- පුවත්පත්, ගුවන් විදුලිය ආදී වශයෙන් එකම අංශයට ඇතුළත් වුවද, යම් අනු කොටස්වලට පමණක් සීමා වූ ආචාර ධර්ම (දම්මුල්ල, 1993).

පුවත්පත් සම්බන්ධව ඉදිරිපත්ව ඇති ආචාර ධර්ම පිළිබඳ විමසීමේදී ප්‍රධාන වශයෙන් කොටස් 02ක් හඳුනාගත හැකිය.

- ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩලයේ ආචාරධර්ම
- ශ්‍රී ලංකා පුවත්පත් පැමිණිලි කොමිසමේ ආචාරධර්ම

ළමා අපයෝජන පිළිබඳ වාර්තාකරණයේදී පුවත්පත් මාධ්‍ය තුළ වන වාර්තාකරණය පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක් යන මාතෘකාව යටතේ කරන ලද මෙම පර්යේෂණ අධ්‍යයනය සඳහා අන්තර්ගත විශ්ලේෂණ ක්‍රමය භාවිත කර ඇත. මෙම අන්තර්ගත විශ්ලේෂණය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක යන දෙයාකාරයෙන්ම සිදු කළ අතර, ගුණාත්මක විශ්ලේෂණයෙහිලා උපයෝගී කොට ගන්නා ලද්දේ වාර්තාකරණය හා සම්බන්ධව පවතින ආචාරධර්මීය පදනම හා පුවත්පත් වාර්තාකරණ ස්වභාවයයි.

ළමා අපයෝජන වාර්තාකරණය පිළිබඳ අධ්‍යයනය අනුව තෝරාගන්නා ලද නියැදිය තුළ පුවත් වාර්තාකරණයන්හි පවතින විවිධ ආචාරධර්ම කඩවීම් හඳුනාගන්නා ලද අතර නියැදියට අදාළව ළමා අපයෝජනය හා සම්බන්ධ ආචාරධර්ම කඩවීම් කවරේද යන්න සොයා බලන ලදි. ඒ අනුව නියැදිය තුළ සමස්ත ආචාරධර්ම කඩවීම් මෙලෙස ප්‍රමාණාත්මකව දැක්විය හැකිය.

වගු අංක - 01 - **නියැදිය තුළ සමස්ත ආචාරධර්ම කඩවීම්වල ස්වභාවය පුවත්පත අනුව හඳුනාගැනීම**

| පුවත්පත | ප්‍රමාණය |
|---|---|
| දිනමිණ | 7 |
| ලංකාදීප | 10 |

මූලාශ්‍රය - අන්තර්ගත විශ්ලේෂණ දත්ත, 2021

සමස්ත ළමා අපයෝජන වාර්තාකරණ අතුරින් 59%ක ප්‍රතිශතයක් ලංකාදීප පුවත්පත තුළ ආචාරධර්ම කඩවීම් සහිත පුවත් වාර්තාවී ඇත. එය නියැදිය තුළ ළමා අපයෝජන සිදුවීම් පිළිබඳ වාර්තාකරණ වැඩි වශයෙන් වාර්තා වූ පුවත්පතය.

එබැවින් දිනමිණ පුවත්පතට වඩා ආචාරධර්ම කඩවීම් හඳුනාගත හැකිය. දිනමිණ පුවත්පත තුළ වාර්තා වූ ළමා අපයෝජන පුවත් ප්‍රමාණය තුළින් ආචාර්යධර්ම කඩ වී ඇත්තේ පුවත් වාර්තාකරණ 7ක පමණ ප්‍රමාණයකය. එය සමස්ත ආචාරධර්ම කඩවීම් අතුරින් 41% ක ප්‍රමාණයකි.

පුවත්පත් ළමා අපයෝජන වාර්තාකරණ පිළිබඳ අධ්‍යයනයේදී නියැදිය අනුව ළමා අපයෝජන වාර්තාකරණය තුළ වූ සමස්ත ආචාරධර්ම කඩවීම් තෝරාගන්නා ලද මාස දෙකක කාලවකවානුව තුළ වෙන් වශයෙන් සොයා බැලීමද මෙහිදී යෝග්‍ය වේ.

වගු අංක - 02 - **නියැදිය තුළ ආචාරධර්ම කඩවීම්වල ස්වභාවය (මාසය සහ පුවත්පත අනුව)**

| මාසය | ප්‍රමාණය |
|---|---|
| ජූලි ලංකාදීප | 7 |
| අගෝස්තු ලංකාදීප | 3 |
| ජූලි දිනමිණ | 3 |
| අගෝස්තු දිනමිණ | 4 |

මූලාශ්‍රය - අන්තර්ගත විශ්ලේෂණ දත්ත, 2021

සමස්ත නියැදියෙහි ළමා අපයෝජන වාර්තාකරණයන්ගේ ආචාරධර්ම කඩවීම් සහිත පුවත් ප්‍රමාණ අතුරින් ජූලි ලංකාදීප පුවත්පතහි පුවත් වාර්තාකරණ 07ක ආචාරධර්ම කඩවීම් නිරූපණය වේ. එය ආචාරධර්ම කඩවීම් හා සම්බන්ධ පුවත් සියල්ල අතුරින් 41% ක ප්‍රතිශතයකි. හඳුනාගන්නා ලද අනෙකුත් ත්‍රිත්වයට අදාළව ආචාරධර්ම කඩවීම් සහිත පුවත් වාර්තාකරණ ඊට වඩා අඩු අගයන් නිරූපණය වනු ඇත. ජූලි දිනමිණ ළමා අපයෝජන පුවත් වාර්තාකරණ සහ අගෝස්තු ලංකාදීප ළමා අපයෝජන පුවත් වාර්තාකරණ තුළ සමාන ආචාරධර්ම කඩවීම් සහිත පුවත් හසුකර ගැනීමට හැකි විය. නමුත් මේ මාස දෙක තුළ දිනමිණ සහ ලංකාදීප පුවත්පත් තුළ ළමා අපයෝජන වාර්තාකරණ පවතිනුයේ අගයන් දෙකකය. අගෝස්තු ලංකාදීප පුවත්පත තුළ ළමා අපයෝජන වාර්තාකරණ 19ක්ද, ජූලි දිනමිණ පුවත්පත තුළ ළමා අපයෝජන වාර්තාකරණ 29ක්ද පවතී. ජූලි දිනමිණ පුවත්පතට වඩා අවම ළමා අපයෝජන වාර්තාකරණ ප්‍රමාණයක් අගෝස්තු දිනමිණ පුවත්පත තුළ පැවතියද එහි ආචාරධර්ම කඩවීම් සහිත පුවත් වාර්තාකරණ 4ක් හඳුනාගත හැකිය. ළමා අපයෝජන වාර්තාකරණයේදී ආචාරධර්ම කඩවීම් සහිත පුවත් වාර්තාවීම පුවත්පතින් පුවත්පතට, මාසයෙන් මාසයට අඩු වැඩි වශයෙන් වාර්තා වනු ඉහත ප්‍රස්තාරය තුළින් හඳුනාගත හැකිය.

වගු අංක 01 සහ 02 අනුව හඳුනාගන්නා ලද ළමා අපයෝජන වාර්තාකරණයේදී දිනමිණ සහ ලංකාදීප පුවත්පත්වල ආචාරධර්ම කඩවීම් ප්‍රමාණ මත එම ආචාරධර්ම කඩවීම් වශයෙන් වෙන්කර ගන්නා ලද තත්වයන්ද විමසා බැලිය යුතුය.

එහිදී, දිනමිණ සහ ලංකාදීප පුවත්පත්වලට අනුකූලව ළමා අපයෝජන වාර්තාකරණය තුළ හඳුනාගන්නා ලද ආචාරධර්ම කඩවීම් අවස්ථා ලෙස,

- වින්දිතයාගේ අනන්‍යතාව හෙළි කිරීම.
- බාලවයස්කරුගේ අනන්‍යතාව හෙළිවන පරිදි වින්දිතයාගේ ඥාතිත්වය හෙළිකර තිබීම.

* නොගැළපෙන පින්තූර භාවිතය

දැක්විය හැකිය. ඒ අනුව සමස්ත නියැදිය තුළ ළමා අපයෝජන පුවත් වාර්තාකරණයේදී ආචාරධර්මීය බව කඩවීම් අවස්ථා නිරූපණය වී ඇති ස්වභාවය පහත වගුව අනුව අවබෝධයක් ලබාගත හැකිය.

වගු අංක - 03 - **නියැදිය අනුව පුවත්පත තුළ ළමා අපයෝජන වාර්තාකරණයේ ආචාරධර්මීය තත්ත්වය**

| ගැටලුවේ ස්වභාවය | පුවත් ප්‍රමාණය |
|---|---|
| වින්දිතයාගේ අනන්‍යතාව හෙළි කිරීම | 8 |
| නොගැළපෙන පින්තූර භාවිතය | 5 |
| බාලවයස්කරුගේ අනන්‍යතාව හෙළිවන පරිදි වින්දිතයාගේ ඥාතිත්වය හෙළිකර තිබීම | 4 |
| **එකතුව** | **17** |

මූලාශ්‍රය - අන්තර්ගත විශ්ලේෂණ දත්ත, 2021

ළමා අපයෝජන පුවත්පත් වාර්තාකරණයෙහි ආචාරධර්මීය තත්ත්වය විමසා බැලීමේදී පුවත්පත් ආචාරධර්ම අනුකූලව විමසා නියැදිය තුළ ආචාරධර්ම කඩවීම් ස්වභාවයන් විමසීමට ලක් කළ හැකිය. එහිදී දිනමිණ සහ ලංකාදීප පුවත්පත්හි ජූලි සහ අගෝස්තු මාස තුළ වාර්තාකරණයට ලක් කරන ලද ළමා අපයෝජන වාර්තා 127ක් අතුරින් ආචාරධර්මීය කඩවීම් සහිත පුවත්පත් වාර්තාකරණ 17ක් ලෙස හඳුනාගත හැක. ඒ අතුරින් ළමා අපයෝජනයට ගොදුරු වූ ළමයාගේ (වින්දිතයාගේ) අනන්‍යතාව පුවත් වාර්තාකරණ 8ක නිරූපණය වේ. එනම්, වින්දිතයාගේ නම් ප්‍රකාශ කිරීම සහ ඡායාරූප දක්වා තිබීම් 53% ක් සමස්ත ආචාරධර්ම කඩවීම් තුළින් නිරූපණය වනු ඇත. එම පුවත් තුළ පළකර ඇති වින්දිතයන්ගේ ඡායාරූප බොඳ කිරීමට ලක් නොකර දක්වා ඇත. ඒ අතුරින් එක් ඡායාරූපයක් පමණක් කළු සුදු ඡායාරූපයකි. තවද, වින්දිතයන්ගේ නම, ගම ආදියද වාර්තාකරණය තුළ සඳහන් කර ඇති වාර්තාකරණද කිහිපයක් විය. වින්දිත බාලවයස්කරුවන්ගේ අනන්‍යතාව හෙළිවන පරිදි අපරාධකරුගේ ඥාතිත්වය හෙළිකිරීම පුවත්පත් වාර්තාකරණයේදී නොකළ යුතු වුවත්, නියැදියට අදාළ පුවත්පත්වල පුවත් වාර්තාකරණ 04ක් තුළ මෙම ගැටලුව අන්තර්ගත වේ. ප්‍රස්තාර අංක 4.8 දැක්වෙන අන්දමට එය සමස්තයෙන් 27% ක ප්‍රතිශතයකි.

එමෙන්ම ළමා අපයෝජන වාර්තාකරණය සම්බන්ධ පුවත් දැක්වීමේදී පුවතේ ස්වභාවය සහ ගැළපෙන ලෙස අඳිනු ලබන පින්තූර භාවිතකිරීම් හඳුනාගත හැකි වූ අතර ඇතැම් පුවත්පත්වල එලෙස පින්තූර භාවිතයේ ශිෂ්ට සම්පන්න බවින් අඩු පින්තූර භාවිත කර ඇත. එලෙස නොගැළපෙන පින්තූර භාවිත කළ පුවත් සංඛ්‍යාව 5කි.

03 වගුව හරහා හඳුනාගත් පුවත්පත තුළ ළමා අපයෝජන වාර්තාකරණයේ ආචාරධර්මීය තත්ත්වයේ ස්වභාවය තවදුරටත් සොයා බැලීම යෝග්‍ය වේ.

වගු අංක - 04 - **පුවත්පත අනුව ළමා අපයෝජන වාර්තාකරණයේ ආචාරධර්මීය තත්ත්වය**

| ගැටලුව | ජූලි ලංකාදීප | අගෝස්තු ලංකාදීප | ජූලි දිනමිණ | අගෝස්තු දිනමිණ |
|---|---|---|---|---|
| වින්දිතයාගේ අනන්‍යතාව හෙළි කිරීම | 2 | 2 | 1 | 3 |
| නොගැළපෙන පින්තූර භාවිතය | 3 | 1 | 1 | 0 |

| | | | | |
|---|---|---|---|---|
| බාලවයස්කරුගේ අනන්‍යතාව හෙළිවන පරිදි වින්දිතයාගේ ඥාතිත්වය හෙළිකර තිබීම | 2 | 0 | 1 | 1 |

මූලාශ්‍රය - අන්තර්ගත විශ්ලේෂණ දත්ත, 2021

මේ අනුව අගෝස්තු දිනමිණ ළමා අපයෝජන වාර්තාකරණයේදී වින්දිතයාගේ අනන්‍යතාව වාර්තාකරණ තුනකදී ඉදිරිපත්ව පැවැතියද එහි සමස්ත ළමා අපයෝජන වාර්තාකරණ ප්‍රමාණය වූයේ 21ක් පමණි. ළමා අපයෝජන වාර්තාකරණ 58ක් වාර්තාවී ඇති ජූලි ලංකාදීප පුවත්පත තුළ වින්දිතයන්ගේ අනන්‍යතාව හෙළි කිරීම් පවතිනුයේ වාර්තාකරණ 2කි. ලංකාදීප සහ දිනමිණ පුවත්පත් ද්විත්වයෙහි අගෝස්තු මස බාලවයස්කරුගේ අනන්‍යතාව හෙළිවන පරිදි වින්දිතයාගේ ඥාතිත්වය හෙළිකර තිබීම සහ නොගැළපෙන පින්තූර භාවිතය යන ගැටලු සහගත අවස්ථා කිසිවක් නිරූපණයවී නොමැත. මේ අනුව දිනමිණ සහ ලංකාදීප පුවත්පත්හි ජූලි සහ අගෝස්තු මාස තුළ වාර්තාකරණයට ලක් කරන ලද සමස්ත ළමා අපයෝජන වාර්තා 127 අතුරින් හඳුනාගන්නා ලද ආචාරධර්මීය කඩවීම් සහිත පුවත්පත් වාර්තාකරණ 17 මෙලෙස බෙදී ගොස් ඇති ආකාරය හැඳිනගත හැකිය.

## 4. සමාලෝචනය

ළමා අපයෝජනය පිළිබඳ මාධ්‍ය වාර්තාකරණය නිසි ලෙස සැලකිලිමත් වෙමින් සිදුකළ යුතු විෂය පථයකි. සිද්ධි වාර්තාකරණයෙන් ඔබ්බට ගොස් සමාජයට යහපත් පණිවුඩයක් ලබාදීමට ළමා අපයෝජන වාර්තාකරණය තුළින් කටයුතු කළ යුතුය. මේ තුළ සමාජයේ වැඩි අවධානය යොමුවූ සිදුවීමක් හැර සෙසු ළමා අපයෝජන සිදුවීම් වාර්තාකර පවතිනුයේ එක් අවස්ථාවක් පමණක් වීම සහ පුවත් වාර්තාකරණයේදී පුවත්පත් ආචාරධර්ම කෙරෙහි යොමු කරන ලද අවධානය අවම මට්ටමක පැවති බව හඳුනා ගතහැකි විය.

ළමා අපයෝජන වාර්තාකිරීම් කරන ආකාරය අනුව අපයෝජනයට ලක්වන දරුවාට වන පීඩනය මෙන්ම සමාජයේ අනෙක් පුද්ගලයන්ද එවැනි අපයෝජන කිරීමට ඉඟි ලබාගත හැකි අවස්ථාවෙන්ද වාර්තාකරණය සිදුවේ. සිද්ධි වාර්තා නොකර දඬුවම හා වැරැද්ද වාර්තා කර සමාජයට යහපතක් කිරීමට මාධ්‍ය කටයුතු කළ යුතු වේ. පුවත්පත් හරහා සිදුකරන ළමා අපයෝජන වාර්තාකරණයේදී එකම පුවත දිගුකාලීන වශයෙන් වාර්තා කිරීම, අපයෝජනයට ලක් වූ දරුවන්ගේ මුහුණු පෙන්වීම, එම අපයෝජනය සිදු කිරීමට සැලසුම් කළ ආකාර පිළිබඳව ඉදිරිපත් කිරීම් දැක්වීම් ආදිය ඔස්සේ දරුවන් සැබෑ විටම ආරක්ෂා වන්නේද යන්න ගැටලු සහගතය. ළමා අපයෝජකයන් නීතියේ රැහැනට හසුකරදීමට ජනමාධ්‍ය කටයුතු කළ යුත්තේ කිනම් පදනමක සිටද, එහිදී ආරක්ෂා විය යුතු ජනමාධ්‍ය ආචාර ධර්ම මොනවාද, කෙරෙහි අවධානය යොමු කිරීම වැදගත්ය. මූල්‍ය පරමාර්ථයෙන් තොරව දරුවන්ට හානි නොවන අයුරින් ළමා අපයෝජන වාර්තාකරණයන් සිදුකළ යුතුය. නමුත් කුණු රසට ඇබ්බැහිවූ පාඨකයන් විසින් බලාපොරොත්තු වනුයේ හාත්පසින්ම වෙනස් තත්ත්වයකි. එබැවින් මාධ්‍යයටද පාඨකයා බලාපොරොත්තු වන ආකාරයට අන්තර්ගතයන් ඉදිරිපත් කිරීමට සිදුවනු ඇත.

මාධ්‍ය වාර්තාකරණයේදී වාර්තා පළ කරන්නේ කවරාකාරයෙන්ද යන්න පිළිබඳ ප්‍රතිපත්තියක් සකසාගත යුතුය. මාධ්‍ය අවශ්‍යතාවටම සහ උවමනාවට සිද්ධි වාර්තා කිරීම නොකර වාර්තා කිරීමට සුදුසු යාන්ත්‍රණයක් ගොඩනගා ගැනීම ළමා සමාජය සුරක්ෂිතව අනාගතයට බාරදීමට එක් මාර්ගයක් වනු ඇත. එබැවින් ළමා අපයෝජන වාර්තාකරණයේදී ළමයාගේත් සමාජයේත් සාර්ථක පැවැත්ම කෙරෙහි අවධානය යොමු කරමින් වාර්තාකරණය කිරීමට වාර්තාකරුවා කටයුතු කළ යුතුය. මෙම තත්ත්වය යටතේ රටක ඉදිරි අනාගතයේ තීරණාත්මක සාධකයක් වන දරුවන් පිළිබඳ අපයෝජන සිදුවීම් වාර්තාකරණය තුළදී නිසි අවධානය යොමු කිරීම කාලෝචිත මෙන්ම ප්‍රායෝගික වශයෙන්ද වැදගත් වේ.

## පරිශීලිත මූලාශ්‍රය


කරුණානායක, එන්., 2001. ***පුවත්පත් කලාව මතවාද හා සංකල්ප***, දිවුලපිටිය: සරස්වතී ප්‍රකාශකයෝ.

කුරේ, එන්., 2007. ***ශ්‍රී ලංකාවේ සිදුවන ළමා අපයෝජන.*** මීරිගම: ආශිර්වාද ප්‍රකාශකයෝ.

ගුණසේකර, ඊ., 2017. ***ළමා අපයෝජන පිළිබඳ වාර්තාකරණයේ දී ජනමාධ්‍යවේදියාගේ භූමිකාව,*** කර්තෘ ප්‍රකාශන.

ජිනදාස, එම්., 2012. ***මාධ්‍ය හා නව මාධ්‍ය ඉතිහාසය,*** කර්තෘ ප්‍රකාශන.

දැරංගල, එස්., 2004. ***පුවත්පත් මාධ්‍ය සන්නිවේදන ලිපි සමුච්චය,*** කොළඹ 10: සහස්‍ර ප්‍රකාශකයෝ.

දැරංගල, එස්., 2020. ***පුවත්පත් මාධ්‍ය ප්‍රවෘත්ති ඒකරාශීකරණය සහ වාර්තාකරණය***, පොල්ගස්ඕවිට: පිවිතුරු ප්‍රකාශන.

හපුආරච්චි, ඒ., 2004. ***ජනමාධ්‍යවේද ලිපි.*** කොළඹ: රත්න ප්‍රකාශකයෝ.

Cheit, R.E., (2003). ***What hysteria? A systematic study of newspaper coverage of accused child molesters, Child Abuse & Neglect,*** 27(6), pp.607–623.